**ශීර්ෂ 441 ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මතය**

ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් අඩංගු සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ගණන්දීමේ නිලධාරී වෙත 2022 ජුනි 28 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**-----------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

සමාලෝචිත වර්ෂය තුල ස්ථාපිත කරන ලද නව අමාත්‍යාංශයක් වූ බැවින් මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සඳහා පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**---------------------**

**2.1 අග්‍රිම කළමනාකරණය**

**------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>---------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>---------------------------------- | නිර්දේශය<br>------------ |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සැලසුම්කර තිබුණු පරිදි ඉල්ලුම් කළ යුතු අග්‍රිම මුදල රු.65,376,800 ක් වුවද, රු.58,076,700 ක් පමණක් ඉල්ලුම් කර තිබුණි. ඒ අනුව අග්‍රිම සැලසුම් කිරීම මඟින් අපේක්ෂිත අරමුණ ඉටුවී නොතිබුණි. කෙසේ වුවද භාණ්ඩාගාරය විසින් නිකුත් කර තිබුණු අග්‍රිමය රු.41,810,000 ක් පමණක් වූයෙන් රු.16,266,700 ක අග්‍රිම නිකුත් නොකිරීම නිසා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන සැලසුම් කළ පරිදි උපයෝජනය කළ නොහැකිවී තිබුණි. | නිරීක්ෂණය හා එකඟ වන බව සහ අපේක්ෂිත සැලසුම් අනුව ප්‍රතිපාදන වෙන් කරවා ගැනීම සිදු කළ නමුත් සත්‍ය අවශ්‍යතාවය අනුව අග්‍රිම ඉල්ලුම් කිරීම සිදුකළ බව. | නිවැරදි හා තාත්වික සැලසුමකට අනුව අග්‍රිම ඉල්ලුම් කළ යුතුය. |

## 2.2 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව නිවැරදි හා තාත්වික ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු බව පහතින් දැක්වෙන නිරීක්ෂණවලට අනුව තහවුරු විය.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් 02 ක් සඳහා සලසා ගෙන තිබුණු රු.3,000,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම, මුදල් රෙගුලාසි 66 හා 69 මඟින් වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි. තවද පුනරාවර්තන වැය විෂයයන් 02 ක් සඳහා සලසා ගෙන තිබුණු රු.1,500,000 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන්, රු.1,300,000 ක් හෙවත් සියයට 80 ත් සියයට 90 ත් අතර ප්‍රතිශතයකින් මුදල් රෙගුලාසි 66 හා 69 මඟින් වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි. | නිරීක්ෂණ හා එකඟ වන බව සහ මෙම අඩුපාඩු ඉදිරියේදී නිවැරදි කරන බව. | නිවැරදි හා තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |
| (ආ) | පුනරාවර්තන වැය විෂයයන් 02 ක් හා මූලධන වැය විෂයයන් 03 ක් සඳහා සලසා ගෙන තිබුණු පිළිවෙලින් රු.265,000,000 ක් හා රු.8,000,000 ක් වශයෙන් වූ ප්‍රතිපාදන, පරිපූරක ඇස්තමේන්තු මගින් හා මුදල් රෙගුලාසි 66 මාරුකිරීම් මඟින් පිළිවෙලින් රු.603,000,000 කින් හා රු.35,350,000 කින් හෙවත් සියයට 100 සිට සියයට 300 දක්වා ප්‍රතිශතයන්ගෙන් වැඩි කර ගෙන තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | පුනරාවර්තන වැය විෂයයන් 07 ක් හා මූලධන වැය විෂයයන් 06 ක් සඳහා සලසා ගෙන තිබුණු එකතුව රු.61,500,000 ක ප්‍රතිපාදනවලින් රු.900,000 ක් වෙනත් වැය විෂයයන් වෙත මාරු කිරීමෙන් පසුව ඉතිරි රු.60,600,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඈ) | මූලධන වැය විෂයයන් 03 ක් හා පුනරාවර්තන වැය විෂයයන් 17 ක් සඳහා සලසාගෙන තිබුණු රු.286,700,000 ක්වූ ප්‍රතිපාදනවලින් රු.10,600,000 ක් වෙනත් වැය විෂයයන්ට මාරු කිරීමෙන් පසුව ඉතිරි රු.276,100,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.190,163,190 ක ප්‍රතිපාදන උපයෝජනයට ගෙන නොතිබුණි. එම ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 ත් සියයට 99 ත් අතර ප්‍රතිශතයක් ගෙන තිබුණි. | -එම- | -එම- |

**2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

---

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දින වන විට ගෙවිය යුතුව පැවති රාජ්‍ය අමාත්‍යතුමියගේ හා කාර්යමණ්ඩලයේ 2021 නොවැම්බර් හා දෙසැම්බර් මාසයන්හි දුරකථන බිල්පත් හා අනෙකුත් ගෙවීමට ඇති බිල්පත්වල එකතුව රු.70,537 ක් සටහන (iii) ආකෘතියට අනුව වූ 2021 දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි. | නිරීක්ෂණය හා එකඟ වන බව, 2022 වර්ෂයේ සිට බැරකම් ලේඛන පවත්වා ගැනීමට නිලධාරීන් දැනුවත් කළ බව සහ බැරකම් ලේඛනය ආරම්භ කර ඇති බව. | සියළුම බැඳීම් හා බැරකම්, බැඳීම් හා බැරකම් ප්‍රකාශනයට ඇතුළත් කළ යුතුය. |

## 2.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයින්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | නිරීක්ෂණය හා එකඟ වන බව සහ 2022 වර්ෂයේ සිට ඇප ලේඛනය පිළියෙල කළ බව. | ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ විධිමත් පරිදි ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | නිරීක්ෂණය හා එකඟ වන බව සහ 2022 වර්ෂයේ සිට හානි පිළිබඳ ලේඛනය පිළියෙල කළ බව. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය. |

## 2.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | නිරීක්ෂණය හා එකඟ වන බව සහ අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කර පවත්වා ගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කරන බව. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | රාජ්‍ය පරිපාලන අමාත්‍යාශය වෙත ලිඛිත ඉල්ලීම් සිදුකළ නමුත් මේ දක්වාම අභ්‍යන්තර විගණකවරයකු අනුයුක්ත කර නොමැති බව, එම නිසාම අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල නොකළ බව හා රාජ්‍ය අමාත්‍යාංශය සඳහා විගණන නිලධාරීන් පත්කරන ලෙස කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින්ද රාජ්‍ය පරිපාලන අමාත්‍යාශයට ලිඛිතව දන්වා ඇති බව. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 දැක්ම හා මෙහෙවර

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් මස 11 දිනැති අංක 2205/14 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින්, කොවිඩ් - 19 සහ වෙනත් බෝවන රෝග පාලනය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය හා සම්බන්ධීකරණයෙන් සියලු පළාත් හා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල සමඟ ඒකාබද්ධ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම, වසංගත රෝග ව්‍යාප්තවීම වැළැක්වීම සඳහා කටයුතු කිරීම හා මාතෘ හා ළදරු මරණ අවම රටක් ලෙස පවත්වා ගැනීමට මාතෘ හා ළදරු සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීම, ග්‍රාමීය ජනතාවට පහසුවෙන් තම සෞඛ්‍ය සේවාවන් ලබා ගැනීමට හැකිවන පරිදි සියලුම ප්‍රාදේශීය හා ප්‍රාථමික රෝහල්වල වෛද්‍ය, හෙද හා ආශ්‍රිත අනෙකුත් සහායක පහසුකම් වැඩි දියුණු කිරීම, දරුවන්ගේ ප්‍රතිශක්තිකරණය වැඩිකිරීම සඳහා අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ප්‍රාථමික සෞඛ්‍ය සේවා හා මූලික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම, ජනතාවගේ සෞඛ්‍ය අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන හා | 2020 දෙසැම්බර් 11 දිනැති අංක 2205/14 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් රාජ්‍ය අමාත්‍යාංශය වෙත බලතල පවරා නොතිබුණු බව සත්‍යයක් බව, එම ගැසට් පත්‍රය අප විසින් සකස් කරන ලද්දක් නොවන බව සහ 2021 වර්ෂයට අදාළව සකස් කරන ලද වාර්ෂික කාර්ය සාධන වාර්තාවට රාජ්‍ය අමාත්‍යාංශයේ අරමුණු හා කාර්යයන් යටතේ අප විසින් ඉටු නොකළ සහ බලතල පැවරී නොමැති සුවිශේෂී කාර්යයන් සඳහන් නොකළ බව. | මෙම තත්ත්වය වගකිව යුතු පාර්ශවයන්ට සන්නිවේදනය කර අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ග්‍රාමීය, පසුගාමී හා නාගරික ප්‍රදේශවල අඩු ආදායම්ලාභීන් ඉලක්ක කර ගනිමින් වැඩිහිටි සෞඛ්‍ය අවශ්‍යතා පහසුකම් පුළුල් කිරීම, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, පවුල් සෞඛ්‍ය සේවා, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන සතු ඩිස්පැන්සරි හා මාතෘ සායන සම්බන්ධීකරණය කරමින් අඩු ආදායම්ලාභී සහ ග්‍රාමීය ජනතාවගේ සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීම යනාදිය රාජ්‍ය අමාත්‍යාංශයට අයත් සුවිශේෂී ප්‍රමුඛතා කාර්යයන් ලෙස හඳුන්වාදී තිබුණි. නමුත් රාජ්‍ය අමාත්‍යාංශයට මෙම කාර්යයන් ඉටු කිරීමට අදාළ අණපනත් ක්‍රියාත්මක කිරීමේ හෝ ආයතනවල භාරකාරිත්වය ඇතුළත් තීරණ ගැනීමේ බලතල පවරා දීමක් සිදුකර නොතිබුණි. මේ හේතුවෙන් 2021 වර්ෂයට අදාළව සකස්කර තිබුණු කෙටුම්පත් වාර්ෂික කර්යසාධන වාර්තාවේ රාජ්‍ය අමාත්‍යාංශයේ අරමුණු හා කාර්යයන් යටතේ ඉහත දැක්වෙන සුවිශේෂී ප්‍රමුඛතා කාර්යයන් සඳහන් කර නොතිබුණි.

**3.2 රජයේ නිලධාරීන් ඇප තැබීම**

---

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව, රාජ්‍ය අමාත්‍යාංශයට අයත් බැංකු ගිණුම පිළිබඳව කටයුතු කරන හා බඩු බාහිරාදිය භාරව සිටින නිලධාරීන් තිදෙනෙකු විසින් ඇප තැන්පත් කර නොතිබුණි. | ඇප තැන්පත් කර නැති නිලධාරීන් සඳහා ඇප තැන්පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | අදාළ සියළු නිලධාරීන්ගෙන් නියමිත පරිදි ඇප තැන්පත් ලබා ගත යුතුය. |

## 3.3 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අප්‍රේල් 19 දිනැතිව රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කර තිබුණු අංක 03/2017 දරන චක්‍රලේඛය ප්‍රකාරව, සියළුම රජයේ ආයතනවල ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම මගින් නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වාර්තා තබා ගැනීමට පියවර ගත යුතුය. තවද 2017 මැයි 12 දිනැතිව භාණ්ඩාගාර ලේකම්වරයා විසින් නිකුත් කර තිබුණු අංක DMS/0016 දරන ලිපිය ප්‍රකාරව, සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සනාථ කළ හැකි පරිදි ඇඟිලි සළකුණු යන්ත්‍ර 2017 ජූලි 01 දින සිට ක්‍රියාත්මක නොකරන්නේ නම් වර්තමාන වැටුපට අනුව අතිකාල දීමනා නොගෙවීමට වගබලා ගත යුතු බව ලේකම්වරයාට දැනුම්දී තිබුණි. මෙම චක්‍රලේඛයේ හා ලිපියේ සඳහන් විධිවිධාන 2021 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් පැමිණීම පිටවීම සටහන් කිරීමකින් තොරව රාජ්‍ය අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී වැටුප් සඳහා රු.12,821,220 ක්ද අතිකාල හා නිවාඩු දින වැටුප් වෙනුවෙන් රු.5,572,534 ක්ද ලෙස මුළු මුදල රු.18,393,754 ක් ගෙවා තිබුණි. | රාජ්‍ය අමාත්‍යාංශය විසින් ගිණුම් කටයුතු ඉටු කරන ලද්දේ පරිපූරක ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදන සලසා ගත් පසු 2021 ඔක්තොම්බර් මස සිට බව, එතෙක් සියලුම ගිණුම් කටයුතු ඉටු කරන ලද්දේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ගිණුම් අංශය විසින් බව, එවකට රාජ්‍ය අමාත්‍යාංශය පැවතුනේ සෞඛ්‍ය අමාත්‍යාංශ කාමරයක වන බැවින් එහි ඇඟිලි සලකුණු යන්ත්‍ර සවි කිරීමේ අවකාශයක් නොතිබුණු බව, රාජ්‍ය අමාත්‍යාංශය සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ පිහිටුවූ කාලය මුළුල්ලේම, කොවිඩ් 19 වසංගත රෝග තත්ත්වය මත ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයක් සිදු නොකළ බව, ඇඟිලි සලකුණු යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා මිල ගණන් ලබා ගත් නමුත් එවකට 15 කටද අඩු වූ කාර්යය මණ්ඩලය සඳහා එවැන්නක් මිලදී ගැනීම ඵලදායී නොවන බැවින් ඉටු නොකරන ලද බව, දක්වා ඇති අතිකාල වියදම් ලබාගෙන ඇත්තේ ගරු අමාත්‍යතුමියගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ රියදුරන් ඇතුළු අනෙකුත් අය විසින් බව සහ ඔවුන්ගේ ඇඟිලි සලකුණු තබන්නේ නැති බව. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |

## 4. යහපාලනය

-------------

### 4.1 විගණන හා කළමනාකරණ කමිටුව

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (1), 2016 ජනවාරි 28 දිනැති අංක DMA/2009(1)(i) සහ 2019 ජනවාරි 12 දිනැති අංක DMA/1-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව , කාර්තුවකට 01 බැගින් වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | රාජ්‍ය අමාත්‍යාංශය සඳහා මේ දක්වාම අභ්‍යන්තර විගණකවරයෙකු නොමැති බැවින් 2021 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීමට නොහැකි වූ බව සහ 2022 වර්ෂයේදී අභ්‍යන්තර විගණකවරයෙකු නොමැතිව වුවද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පවත්වන ලද බව. | කළමනාකරණ විගණන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 4.2 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 04 දින ස්ථාපිත කර තිබුණු රාජ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතට සමාජ සේවා දෙපාර්තමේන්තුව, වැඩිහිටි මහලේකම් කාර්යාලය හා 1990 සුවසැරිය පදනම යන ආයතන පමණක් ඇතුළත් කර තිබුණු නමුත් රාජ්‍ය අමාත්‍යාංශයේ විෂය පථය පිළිබඳව විධිමත් අධ්‍යයනයකින් තොරව 80 ක කාර්යමණ්ඩලයක් අනුමත කරවා ගෙන තිබුණි. වෛද්‍ය පරිපාලක සේවා තනතුරුවලට අදාළ රාජකාරි මෙම අමාත්‍යාංශය විසින් ඉටුනොකරන නමුත් අතිරේක ලේකම්වරයෙකු ඇතුළුව වෛද්‍ය පරිපාලක සේවා තනතුරු 05 ක් හා වෛද්‍ය නිලධාරි තනතුරු 03 ක් | මෙම රාජ්‍ය අමාත්‍යාංශය ස්ථාපිත කළ අවස්ථාවේදී ගැසට් පත්‍රයෙන් පැවරී ඇති කාර්යයභාරය හා බලතල පිළිබඳ සලකා බැලීමකින් තොරව එවකට සිටි නිලධාරීන් විසින් අමාත්‍යාංශයේ නම ගැන පමණක් සලකා කාර්ය මණ්ඩලය අනුමත කරවාගෙන ඇති බව, පසුව මේ පිළිබඳව අප විසින් අධ්‍යයනය කිරීමෙන් අනතුරුව අනවශ්‍ය කාර්යය මණ්ඩල බඳවා නොගන්නා ලද බව සහ ඉදිරියේදී මෙම අමාත්‍යාංශයට පැවරෙන | අමාත්‍යාංශයට පැවරෙන විෂය පථය සලකා බලා අවශ්‍ය කාර්ය මණ්ඩලය අනුමත කර ගත යුතුය. |

අනුමත කාර්ය මණ්ඩලයට අයත් විය. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රාජ්‍ය අමාත්‍යාංශයේ තත්‍ය සමස්ථ කාර්යමණ්ඩලය 15 ක් පමණක් විය.

කාර්යයභාරය අනුව දැනට පවත්නා කාර්යය මණ්ඩල සංශෝධනය කර අනුමත කර ගැනීමට සටහන් කර ගත් බව.